ප්‍රධාන කරුණු සංක්ෂිප්තය

BOC My Health විශේෂ ඉතිරිකිරීමේ ගිණුම

නිමැවුමේ ස්වභාවය	ගනුදෙනුකරුට ලැබෙන ප්‍රතිලාභ	ආරම්භක තැන්පතු හා ගාස්තු	සුදුසුකම්	ප්‍රධාන නියම හා කොන්දේසි
සෞඛ්‍ය ඉතුරුම් ගිණුම	• **පොලී අනුපාතය -** සාමාන්‍ය ඉතුරුම් අනුපාතය නවතම පොලී අනුපාතය දැනගැනීමට https://www.boc.lk/rates-tariff#rupee-deposit-rates වෙත පිවිසෙන්න. • යම් නිශ්චිත වර්ෂයක දී කිසිදු ආපසු ගැනීමක් සිදුකර නොමැති ගිණුම් වෙත සෑම වර්ෂයක් අවසානයේදී ම උපයන ලද වාර්ෂික පොලිය මත (දැනට 25% ක බෝනස්) 'No-Claim' දීමනා හිමිවේ. • **ශල්‍ය හා රෝහල්ගතවීමේ රක්ෂණාවරණය** යම් අනතුරක් සිදුවීමට පෙරාතුවම වූ අඛණ්ඩ මාස 12ක කාලසීමාවක් සඳහා රු 250,000/-ක අවම ශේෂයක් ලංකා බැංකුවේ 'My Health' විශේෂ ඉතුරුම් ගිණුමේ පවත්වා ගත යුතුය. සුදුසුකම් ලබන වයස - ගිණුම විවෘතකරන අවස්ථාවේදී වයස අවු. 18-60 අතර සුදුසුකම් ලබන වයස - හිමිකම් මුදල ලබාගන්නා අවස්ථාවේදී වයස අවු. 19-70 අතර මෙම රක්ෂණාවරණය - (1) හදිසි අනතුරු සහ (2) පහත දැක්වෙන බරපතල රෝගාබාධ හේතුවෙන් ගිණුම්හිමියා රජයේ හෝ පෞද්ගලික රෝහලක රෝහල්ගතවීම හෝ ශල්‍යකර්මයකට මුහුණදීම වෙනුවෙන් ලබාදේ. ▪ වකුගඩු අකර්මණ්‍යවීම ▪ පිළිකා ▪ මොළයේ ගෙඩි ▪ ආඝාතය ▪ ලියුකේමියාව ▪ ඇපෙන්ඩිසයිටිස් ▪ හර්නියා ▪ කෝමා ▪ පාකින්සන් ▪ ඩිමෙන්ශියා ▪ අංශභාගය ▪ ප්‍රධාන අවයව බද්ධකිරීම ▪ හදවත් රෝග - කිරීටක ධමනි සැත්කම (බයිපාස්), ▪ හෘද කපාට සැත්කම, ඇන්ජියෝප්ලාස්ටි	**ආරම්භක තැන්පතුව- රු.**1,500/- **- ගිණුමේ පවතින අවම මාසික සාමාන්‍ය ශේෂය රු. 500/-ට වඩා අඩු වේ නම්, මසකට රු. 35/-ක ගාස්තුවක් අයකරනු ලැබේ.** **ගිණුම වසාදැමීමේ ගාස්තු - රු.500/-** **ගිණුම පවත්වාගෙන යාමේ හා වෙනත් ගාස්තු** - ATM කාඩ්පත් නිකුත්කිරීම - බැංකු ප්‍රකාශ ලබාගැනීම - පාස්පොතේ අනුපිටපතක් නිකුත්කිරීම - ගිණුම් ශේෂයන් තහවුරු කිරීම - ස්ථාවර නියෝග වෙත ලියාපදිංචිවීම හා මුදල් හුවමාරුකිරීම - SMS Alerts ගාස්තු - ATM වෙතින් මුදල් ගැනීමේ සීමාව වෙනස්වීම - අන්තර්ජාල බැංකුකරණ සේවා ගාස්තු ගාස්තු දැනගැනීමට https://www.boc.lk/ratestariff#general-tariff වෙත පිවිසෙන්න. • **බදු -** පොලිය රජය සහ/හෝ ශ්‍රී ලංකා නියාමන අධිකාරිය හෝ බැංකුව විසින්	- වයස අවු. 18ට වැඩි ශ්‍රී ලංකාවේ නේවාසිකයන්ට මෙම ගිණුම විවෘත කළ හැකිය. - මේ යටතේ එක ගනුදෙනුකරුවකුට ගිණුම් කිහිපයක් විවෘතකළ නොහැකිය. - තනි පුද්ගල ගිණුම් පමණක් විවෘත කළ හැකිය. බද්ධ ගිණුම්වලට අවසර නොලැබේ. **ගිණුම විවෘතකිරීම සඳහා අනුගමනය කළයුතු පියවර** - ගිණුමට අදාළ නියමයන් හා කොන්දේසිවලට එකඟතාව පළකළ ලේඛනය; - ඉතුරුම් ගිණුමට අදාළ නියමයන් හා කොන්දේසි සඳහා වන කැමැත්ත; - ජාතික හැඳුනුම්පතේ (NIC)/ NIC අංකය දැක්වෙන වලංගු විදේශ ගමන් බලපත්‍රයේ පිටපතක්; - දැන් සිටින ලිපිනය හා NICහි සඳහන් ලිපිනය වෙනස් වේ නම්, ලිපිනය තහවුරුකිරීමේ ලේඛන; - ගිණුම විවෘත කරන බැංකු ශාඛාවට අයදුම්පතේ දී ඇති ස්ථිර ලිපිනය දුරින් පිහිටා තිබේ නම් ඒ සඳහා වලංගු හේතුවක් ද සමග, ඉතිරිකිරීමේ ගිණුම් විවෘතකිරීමේ විශේෂ අයදුම්පත සම්පූර්ණ කර ඕනෑම බැංකු ශාඛාවක් වෙත ලබාදෙන්න.	- ගිණුමෙන් ලබාදෙන විශේෂ ප්‍රතිලාභ ලබාගැනීම සඳහා (උදා: රක්ෂණය, ත්‍යාගය, වැනි) ගිණුම්හිමියා විසින් ගිණුම් ශේෂය/තැන්පතුව, වයස් සීමාව වැනි කලින් කලට බැංකුව විසින් තීරණය කරනු ලබන නියමිත නිර්ණායක සපුරාලිය යුතුවේ. - දීමනා අනුපාතය බැංකුවේ අභිමතය පරිදි කලින් කලට වෙනස්විය හැකි අතර එම වෙනස්කම් ක්‍රියාත්මක වූ දින සිට පවත්නා ගිණුම්වලට මෙන්ම අලුතින් විවෘතකරන යන සියලුම ගිණුම්වලට එම සංශෝධනයන් අදාළ වේ. - දීමනා මුදල ගිණුම්හිමියා විසින් පසුව එන වර්ෂයේදී ලබාගත හැකි අතර එය පසුව එන කාලසීමාවට 'No-Claim' දීමනාව ගණනයකිරීම සඳහා ආපසුගැනීමක් (දීමනා මුදල දක්වා) ලෙස සලකනු නොලැබේ. - ඉහත සඳහන් කළ හදිසි අනතුරු හෝ බරපතල රෝග සඳහා පමණක් රක්ෂණ හිමිකම් ලබාගත යුතු අතර දීර්ඝකාලීන හෝ සංජානනීය රෝග

Classification: Internal

	එක් ගනුදෙනුකරුවකුට එක් වසරකට රු. 250,000/-ක වාර්ෂික සීමාවක් දක්වා වන රක්ෂණ මුදල **<u>ප්‍රතිලාභ</u>** (i) රෝහල්ගත්වීම රජයේ හෝ පෞද්ගලික රෝහලකද යන්න නොසලකා, රු 250,000/-ක සමස්ත වාර්ෂික සීමාවට යටත්ව, දිනකට රු. 5,000/- (රක්ෂණ සමාගම විසින් පනවන ලද උපරිම දින ගණනට/ කාලයට යටත්ව); හෝ (ii) බිල්පත් ප්‍රතිපූරණයකිරීමේ පහසුකම රු. 250,000/-ක සමස්ත වාර්ෂික සීමාවක් දක්වා (දිනකට උපරිම කාමර ගාස්තු රු. 5,000/-කට සහ රක්ෂණ සමාගම විසින් පනවන ලද අයිතම වශයෙන් වන උපරිම සීමාවන්ට යටත්ව) • **සෞඛ්‍ය පරීක්ෂණ වියදම් ප්‍රතිපූරණයකිරීමේ පහසුකම** මෙම පහසුකම ගිණුම්හිමියාට ලබා දේ. සෞඛ්‍ය පරීක්ෂණ සඳහා ගිණුම්හිමියා විසින් දරන ලද වියදම් ප්‍රතිපූර්ණය කිරීම පහත නිර්ණායකයන්ට අනුව සිදුකළ යුතුය. - සුදුසුකම - හිමිකම ලබාගන්නා අවස්ථාව වනවිට අඛණ්ඩව මාස 12ක කාලසීමාවක් රු.500,000/-ක අවම ශේෂයක් පවත්වාගෙන යන BOC 'My Health' ඉතුරුම් ගිණුම - සුදුසුකම් ලබන පරීක්ෂණ - ගිණුම්හිමියාගේ නමින් පවත්වන සෞඛ්‍ය පරීක්ෂණ/ වෛද්‍ය පරීක්ෂණ - ප්‍රතිපූරණය කරන මුදල - මාස 12ක් ඇතුළත එක් ගිණුම්හිමියකුට රු. 12,500/-ක උපරිමය - අවශ්‍ය ලේඛන (සම්පූර්ණ කරන ලද ලේඛන බැංකුවට ඉදිරිපත් කළයුතුය.) සෞඛ්‍ය පරීක්ෂණ ප්‍රතිපූරණය සඳහා වන ඉල්ලුම්පත්‍රය ගිණුම්හිමියාගේ නමින් පවත්වන සෞඛ්‍ය පරීක්ෂණයේ වෛද්‍ය නිර්දේශය ගිණුම්හිමියාගේ නමින් වන බිල්පතේ මුල්පිටපත/ පිටපත් • ගනුදෙනු සඳහා හර කාඩ්පත් • බැංකුව විසින් කලින් කලට ප්‍රකාශිත පරිදි සෞඛ්‍ය ක්ෂේත්‍රයට අදාළ වෙළඳුන්ගෙන් විශේෂ වට්ටම් • හදිසි රෝහල්/ වෛද්‍ය ගාස්තු ගෙවීමට BOC 'My Health' විශේෂ ඉතුරුම් ගිණුමේ ඇති මුදල් ප්‍රමාණවත් නොවන විට BOC ණය කාඩ්පත් හරහා ක්ෂණික මූල්‍ය සහාය. මෙම පහසුකම ලබාගැනීමට ගිණුම්හිමියා BOC ඇමතුම් මධ්‍යස්ථානයට කතාකළ යුතුය. • වරින්වර නොමිලයේ පවත්වන උපදේශන සායන/ දැනුවත්කිරීමේ වැඩසටහන්	කලින් කලට නියමකරනු ලබන අදාළ ඉහළ ආදායම් බදු (Advance Income Tax) අඩුකිරීම්, වෙනත් බදු (AIT), ගාස්තු (ඇත්නම්) වලට සහ ව්‍යවස්ථාපිත අයබදුවලට යටත් වේ.		හෝ වෙනත් යම් රෝග සඳහා ලබාගත නොහැක. - රක්ෂණ හිමිකම්, රක්ෂණ සමාගම විසින් පනවන ලද නියමයන් හා කොන්දේසිවලට යටත් වේ. - රක්ෂණාවරණය ශ්‍රී ලංකාවේදී ලබාගන්නා ප්‍රතිකාර සඳහා වලංගු වේ. - මාස 12ක් තුළ එක් ගිණුම්හිමියකු එක් ප්‍රතිපූර්ණයකට සුදුසුකම් ලබයි. - බිල්පතේ සඳහන් දින සිට මාස තුනක් ඇතුළත ප්‍රතිපූර්ණය කළ යුතුය. - අවශ්‍ය අවම ශේෂය, සුදුසුකම් නිර්ණායක සහ ප්‍රතිලාභ බැංකුවේ අභිමතය පරිදි කලින් කලට සංශෝධනය විය හැකිය. - නිමැවුමට අදාළ සියලුම නියම හා කොන්දේසි දැනගැනීම සඳහා ගිණුම විවෘතකිරීමේ අයදුම්පත බලන්න.

Classification: Internal

රක්ෂණ ආවරණ තැන්පතුව /අනවසර ගනුදෙනු (අතපසුවීම්)/ අක්‍රීය ගිණුම් පිළිබඳ වාර්තාකිරීම

- එක් තැන්පතුකරුවකුට රු.1,100,000 ක උපරිමයක් දක්වා වන්දි සඳහා අදාළ වාරික ගෙවීම මත මුදල් මණ්ඩලය විසින් ක්‍රියාත්මක ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනාක්‍රමය අනුව තැන්පතු වගකීම් රක්ෂණය කර ඇත.
- අනවසර/ අතපසුවූ ගනුදෙනුවක් හඳුනාගතහොත්, ඒ පිළිබඳ බැංකුවට හෝ ගිණුම පවත්වාගෙනයන ශාඛාවට වහාම වාර්තාකළ යුතුය.
- කිසිම මුදල් ආපසුගැනීමක්/ගෙවීමක් නොකර අවුරුද්දක (01) කාලයක් ගිණුම අක්‍රීයව පැවතියහොත්, එක් අවුරුද්දක් අවසානයේ ගිණුම 'අක්‍රීය' වනු ඇත.
- අවුරුදු 10කට වැඩි කාලයක් එම ගිණුම් සක්‍රීයව පැවති බවට කිසිදු සාක්ෂියක් නොමැති නම්, එම ගිණුම්වල පවතින මුදල් අත්හැර දැමූ දේපළක් ලෙස ශ්‍රී ලංකා මහ බැංකුව වෙත මාරුකරනු ලැබේ

ඔබේ අදහස් අප හා බෙදාගන්න

- ගනුදෙනුකරුවන්ට පහත දැක්වෙන කුමන හෝ ක්‍රමයකින් සිය අදහස් සහ පැමිණිලි යොමුකළ හැකිය;
- අපගේ ගනුදෙනුකාර අත්දැකීම් කළමනාකරණ අංශය හරහා ඔබේ ඇගයීම්/ පැමිණිලි යොමු කළ හැකිය. ඔබේ ඉල්ලීම් ස්වයංක්‍රීය පද්ධතියක් හරහා සලකා බලනු ලැබේ.
- **දුරකතන:** +94 11 220 4750 / +94 11 243 5814 **ෆැක්ස්**: +94 11 243 5815 **විද්‍යුත් ලිපිනය**: bocexmgt@boc.lk **වෙබ් අඩවිය:** https://www.boc.lk
- **තැපෑල:** ගනුදෙනුකාර අත්දැකීම් කළමනාකරු, 22වන මහල, ලංකා බැංකු කුළුණ, ලංකා බැංකු චතුරශ්‍රය, අංක. 1, ලංකා බැංකු මාවත, කොළඹ 01.

  අපගේ නිමැවුම් හෝ සේවා සම්බන්ධයෙන් ඇති ඕනෑම විමසීමක් අපගේ ඕනෑම බැංකු ශාඛාවක් වෙත හෝ ඇමතුම් මධ්‍යස්ථානය වෙත යොමු කරන්න. 1975 (ඇමතුම් මධ්‍යස්ථානය) අමතා ඔබට ළඟම ශාඛාව සොයාගන්න.